# විදේශ කටයුතු අමාත්‍යාංශය

# කාර්යාල සේවක සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

විදේශ කටයුතු අමාත්‍යාංශයේ කාර්යාල සේවක සේවයේ III වන ශ්‍රේණියේ තනතුරු 04 ක් සඳහා සුදුස්සන් බඳවා ගැනීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඊ අනුව තමා විසින් ම සකසා ගන්නා ලද අයදුම්පතක් **ලේකම්, විදේශ කටයුතු අමාත්‍යාංශය, ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 01.** යන ලිපිනයට 2016.09.30 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"විදේශ කටයුතු අමාත්‍යාංශයේ කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවකු නම් තම අයදුම්පත තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

**සටහන :** අයදුම්පත්‍රයක් හෝ ඊ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

**01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

i. මෙම තනතුර ස්ථිරය.

**සටහන -** විශ්‍රාමික වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය.

ii. මෙම තනතුර සඳහා පත්වීම් ලබන අය වසර 03 ක පරිවාස කාලයකට යත් විය යුතු වන අතර, පළමු වසර 03 විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කිරීම අනිවාර්යය වේ. තවද පළමු වසර 3 ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

iii. පත්වීම් දින සිට වසර 05 ක් තුළ අදාළ මට්ටමේ දෙවන භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

iv. මෙම බඳවා ගැනීම් සම්බන්ධව 2009.04.02 දින සිට ක්‍රියාත්මක අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතීන්හි පත්කිරීම් සම්බන්ධ පොදු කොන්දේසිද, අංක 1777/35 හා 2012.09.27 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්යාල සේවක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7 හා 8 වගන්ති සහ අංක 1820/4 හා 2013.07.23 දිනැති කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධන අංක 01 හි (i) වගන්තියේ විධිවිධානයන්ද අදාළ වේ.

**03. වැටුප් පරිමාණය :**

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 දරන වැටුප් චක්‍රලේඛය අනුව PL-1-2016, රු. 24,250-10X250-10X270-10X300-36,410 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි II උපලේඛනය පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

**04. සුදුසුකම් :**

i. **අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුළුව විෂයන් හයක් සමත් වී තිබීම.

ii. **වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනමටත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

iii **වෙනත් සුදුසුකම්**

01. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

02. තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයක් අයදුම්කරු සතු විය යුතුය.

03. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**ලේකම්,**
**විදේශ කටයුතු අමාත්‍යාංශය,**
**ජනරජ ගොඩනැගිල්ල,**
**කොළඹ 01.**
2016.09.15